# කිරි කර්මාන්තය නගා සිටුවීමට නම්.............?

එස්. ඇපාසිංහ
*සංඛ්‍යාන නිලධාරී*
කෘෂි හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**තුන්වන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ වර්තමානයේ දේශීය කිරි නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවයෙන් 15% ක් සැපයීම සඳහා ප්‍රමාණවත් ය.** ඉතිරි 85% කිරි පිටි ආකාරයෙන් මෙරටට ආනයනය කරනු ලබයි. 2003 වසර තුල දී කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 67,941 ක් ආනයනය කර ඇති අතර, ඒ සඳහා ආනයන වියදම රුපියල් බිලියන 11.5 ක් විය. ***(මූලාශ්‍රය- ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාව - 2003)*** සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටකට මෙය ඉතා අහිතකර තත්ත්වයකි. මෙරට තුල කිරි කර්මාන්ත ය වඩා සාර්ථකව වර්ධනය කිරීමට අවශ්‍ය සාධක වුවමනාවටත් වඩා වැඩිපුර තිබිය දී, මෙම දේශීය කර්මාන්තය නගා සිටුවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පවතින රජයන්ගේ වගකීමක් හා ජාතික අවශ්‍යතාවයක් වේ.

**ශ්‍රී ලංකාවේ ජන ලේඛන හා සෞඛ්‍ය සමීක්ෂණය (SLDHS - 2000) අනුව, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ මන්දපෝෂණ අනුපාතය 27.5% කි. (Chronic Malnutrition (Stunting) - 13.5% Acute Malnutrition (Wasting) - 14.0% )** තව ද, වයසට සරිලන නියම බර අනුපාතය නොමැති ළමුන්ගේ ප්‍රතිශතය 29.4% කි.මෙවැනි පසුබිමක දී, රටේ සංවර්ධනයට සහාය කරගත හැකි නිරෝගී ජන සමාජයක් බිහි කරලීම අත්‍යාවශ්‍ය ය. එබැවින්, කිරි වලින් මෙරට ස්වයංපෝෂිත කරලීම කාලීනව ප්‍රමුඛතාව දිය යුතු මානව සම්පත් සංවර්ධනයේ ලා වැදගත් සංවර්ධන ව්‍යාපෘතියකි. එසේ වුවත්, පැවති රජයන් මේ දක්වා මේ පිළිබඳ වැඩි උනන්දුවක් දක්වා නොමැති බව වසරින් වසර ආනයනය කරන කිරිපිටි ප්‍රමාණය වැඩි වීමත්, දේශීය නිෂ්පාදන පහත වැටීමත් අනුව පැහැදිලි වේ.

**ජනගහන වර්ධන වේගය අනුව, ඉදිරි වසර වල දී දේශීය කිරි පාරිභෝජනය තව තවත් ඉහල යයි.** මෙම ඉල්ලුම සපුරාලීම සඳහා මෙරට සංවර්ධනය වෙනුවෙන් වැය කල යුතුව තිබෙන මුදල් වලින් ඉහල ප්‍රතිශතයක් විදේශයන්ට ගලා යනු ඇත. මෙවැනි තත්ත්වයක් උද්ගතව ඇති අවස්ථාවක දේශීය කිරි කර්මාන්ත ය නගා සිටුවා කිරි නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත වීමට ජාතික සැලැස්මක, ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව ඉතා වැදගත් වූවකි.

විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ පිවිසි සමාජ - ආර්ථික ව්‍යූහය වෙනස්වීම තුල කිරි ගොවියාට මෙම ක්ෂේත්‍රයේ රැඳී සිටීමට අපහසු වී තිබේ. මේ තත්ත්වය කිරි ගොවියාට කිරි නිෂ්පාදන කර්මාන්තයෙන් දුරස් කරලීමට සමත් වී ඇත. මෙසේ කිරි ගොවියා මෙම ක්ෂේත්‍රයේ දුරස් කරලීමට බලපෑ කරුණු පහත අයුරින් සාරාංශ කොට දැක්විය හැක.

i රජයේ දායකත්වය උපකාර ලැබීම් හා යටිතල පහසුකම් අවම මට්ටමක පැවතීම

කිරි නිෂ්පාදනය නංවාලීමට අවශ්‍ය යටිතල පහසුකම් අනාගත ආයෝජනයක් සේ සැලකිය යුතුය.

ii කිරි සඳහා නිෂ්පාදන මිලට සරිලන මිලක් නොලැබීම

සත්ත්ව ආහාර, බෙහෙත්, පශු වෛද්‍ය පහසුකම් සහ වෙනත් අවශ්‍යතා සඳහා අධික මිලක් ගෙවීමට ගොවියාට සිදු වී තිබේ. මේ තුලින් නිෂ්පාදන වියදම ඉහල ගොස් ඇත. ඊට සාපේක්ෂව කිරි සඳහා ලැබෙන මිල ප්‍රමාණවත් නොවීම ගැටළුවකි. මේ සඳහා පහසුකම් සපයා දිය යුතුය.

iii සත්ත්ව ආහාර මිල අධික වීම

කිරි සඳහා ලැබෙන මිල එසේ තිබියදී වෙළඳපොල අනෙකුත් සාධක මත සත්ත්ව ආහාර මිල ඉහල යාමක් දක්නට තිබේ. සහල් මිල වැඩිවත්ම නිවුඩු මිල ඉහල ගොස් ඇත. රජය මැදිහත්ව ගුණාත්මක වටිනාකමකින් යුතු සත්ත්ව ආහාර නිපදවා ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දිය යුතුය.

iv නව පරපුර මෙම කර්මාන්තයෙන් ඈත්වීම

කිරි ගොවියාට සමාජයේ ඇති පිළිගැනීම ඉතා පහළ තත්ත්වයක පැවතීමත්, මේ තුලින් ජීවත්වීමට සරිලන අදායමක් නොලැබීමත්, මෙයට හේතුවයි. සමාජයේ කිරි ගොවියා පිළිගැනීම -කට ලක්කර ගොවියාගේ තත්ත්වය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය.

v නවීන තාක්ෂණ ක්‍රමෝපායයන් ගුරු නොකිරීම

කිරි නිෂ්පාදන එකතැන පල්වීමට මෙය හේතු වී තිබේ. වැඩි කිරි නිෂ්පාදනයක් ලබා ගන්නා ක්‍රම, කෘත්‍රිම සිංචන මගින් උසස් ආරයේ සතුන් බෝ කර ගැනීම, සාන්ද්‍ර ආහාර භාවිතයෙන් කිරිවල ගුණාත්මක තත්ත්වය දියුණු කිරීම, ඉවත ලන පිදුරු මගින් කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට කටයුතු කිරීම, සතුන්ගේ ජීවත් වන පරිසරය පිළිබඳ ගැටළු ආදිය නවීන ලෝකයත් සමඟ ඒකාබද්ධ වෙමින් නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීමෙන් ගොවියා දිරිමත් කිරීමෙන් කළ යුතුය.

කිරි ගොවි කර්මාන්තයේ දී ඉවතලන ගොම සහ මුත්‍රා වලින් ජීව වායුව නිපදවා එය භාවිත යෙන් ගොවියාගේ ආර්ථිකය නංවා ලීම, කාබනික පොහොර යොදා නිපදවන එළවළු පලතුරු ආදියට වෙළඳපොලේ ඉහල මිලක් හඳුන්වා දීමෙන් එම නිෂ්පාදන ජනප්‍රිය කරවීම, ජීව වායු ඒකකවල අතුරුඵල දිලීර නාශක ලෙස වෙළඳපොලට හඳුන්වාදීම වැනි ක්‍රියා තුලින් ගොවියාගේ ආර්ථිකය වර්ධනය කරලීමට ද හැකිවනු ඇත.

**vi. වැඩි කිරි නිෂ්පාදනයක් ලබාදෙන උසස් ආරයේ සතුන් හිඟකම.**

ආසියාවේ සෙසු රටවල් හා සැසඳීමේ දී, ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන පවතින්නේ ඉතාමත් දුර්වල තත්ත්වයකය. එයට හේතු ව වැඩි කිරි ප්‍රමාණයක් ලබා දෙන උසස් ආරයේ සතුන් නොමැති වීමයි. මේ සඳහා සත්ත්ව අභිජනන ක්‍රම හඳුන්වා දී උසස් ආරයේ සතුන් ලබා දීම කල යුතුය.

> **ජනගහන වර්ධන වේගය අනුව ඉදිරි වසර වල දී දේශීය කිරි පාරිභෝජනය තව තවත් ඉහල යයි.**

**vii. කෘෂි ව්‍යාප්ති සේවයේ පවතින දුර්වලතා**

සාර්ථක පශු වෛද්‍ය සේවාවක් ලබාදීම සිදුකරන්නේ නම් ගොවීන් ගේ උනන්දුව හා නිෂ්පාදන ඵලදායිතාවය වැඩිකර ගත හැකිය.

ශ්‍රී ලංකාවේ කිරි භාවිතය ද ඉතා පහල මට්ටමක පවතී. එහි ගුණාත්මක තත්ත්වය පිළිබඳව නොදැන සිටීමත්, දිළිඳු ආර්ථිකය නිසාත්, එක පුද්ගල කිරි පාරිභෝජනය වසරකට ශ්‍රී ලංකාවේ කි.ග්‍රෑම් 36 පමණ අවම මට්ටමක පවතී. මෙය පිළිවෙලින් ඉන්දියාවේ කි.ග්‍රෑම් 69 වන අතර පකිස්ථාන යේ කි.ග්‍රෑම්.123 කි. මේ නිසා, දේශීය කිරි භාවිතය ඉහල නැංවී-මට ද කටයුතු කිරීම වැදගත් වේ. පවතින තත්ත්ව-යත් හමුවේ දේශීය කිරි කර්මාන්තය නංවාලීමට කටයුතු කල යුතුය. මේ තුලින් සංවර්ධනයට යෙදවිය හැකි විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගැනීමට හැකි වේ. එපමණක් නොව විරැකියාව අවම කර ගැනීමටත් උපකාර වනු නියතය.

කෙසේ වෙතත්, ඉදිරියේ අභියෝග රැසකි. දේශීය කිරි කර්මාන්තය නැංවීමට ජාතික ප්‍රතිපත්තියක් සකසා මේ රට කිරි වලින් ස්වයංපෝෂිත කිරීමට කාලය උදා වී ඇත. ඒ තුලින් කිරි කර්මාන්ත යේ යෙදෙන ලක්‍ෂ සංඛ්‍යාත ගොවි ජනතාවට තිබඳවම සහනයක් සැලසෙනු නොඅනුමානය.


## ගොවි ජනතා

**"ගොවි ජනතා"** සඟරාවේ පසුගිය කලාප කිහිපයක සීමිත පිටපත් සංඛ්‍යාවක් ඉතිරිව තිබේ. දැනට මෙම කලාපයන් **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** ප්‍රකාශන අලෙවි කවුළුවෙන් මිල දී ගැනීමේ හැකියාව පවතී.

එමෙන්ම, අවශ්‍ය කලාප සංඛ්‍යාව සඳහන් කොට, අදාල ගෙවීම මුදල් ඇනවුමකින් ආයතනය වෙත ලැබෙන්නට සැලැස්වීමෙන් අවශ්‍ය පිටපත් ප්‍රමාණය ලබාගත හැකිය.

| කලාපය | තේමාව | මිල |
|---|---|---|
| 2002 ජනවාරි - මාර්තු | ගොවි සමාගම් / ගොවි ගැටළු | රු.20.00 |
| 2002 අප්‍රියෙල් - ජූනි | විකල්ප බල ශක්තිය | රු.20.00 |
| 2003 පෙබ. 21 - විශේෂ කලාපය | ගල්ඔය ගොවි ජනපද ව්‍යාපාරය | රු.20.00 |
| 2003 ජනවාරි - අප්‍රියෙල් | ජල කලමනාකරණය | රු.20.00 |
| 2003 මැයි - ඔක්තෝබර් | ගොවි ණය | රු.20.00 |

සියළු මුදල් ඇනවුම්

**අධ්‍යක්ෂ**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**
**114, විජේරාම මාවත,**
**කොළඹ - 07.**

***දුරකථන : 2696981, 2698540 - 41***